# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල

**මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන ඇතැම් සේවක පන්තිවල ප්‍රයෝජනය සඳහා විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2011 අප්‍රේල් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 මාර්තු මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[99 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 16.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 7.50 යි.**

# විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල

එල්. ඩී.—ඕ. 25/2011.

**මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා සුදුසුකම් ලබන ඇතැම් සේවක පන්තිවල ප්‍රයෝජනය සඳහා විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබන පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

**1.** මේ පනත 2011 අංක    දරන විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පිහිටුවීම හා ඒ අරමුදල පරිපාලනය කිරීම

*විදේශ සේවා නියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල පිහිටුවීම.*

**2.** මේ පනතෙහි කාර්යයන් සඳහා (මින් මතු මේ පනතෙහි "අරමුදල" යයි සඳහන් කරනු ලබන) විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

*අරමුදලෙහි සාමාජිකත්වය.*

**3.** (1) 10 වන වගන්තිය යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමට සේවකයකු පළමුවෙන් ම යටත්වන අවස්ථාවක ඔහු අරමුදලේ සාමාජිකයකු බවට පත් විය යුතු අතර, අරමුදලෙහි ඔහුගේ පෞද්ගලික ගිණුමේ බැරට යම් මුදලක් තිබෙන තෙක් ඔහු අරමුදලෙහි සාමාජිකයකු වශයෙන් සිටිය යුතු ය.

(2) මේ පනතෙහි යම් විධිවිධානයක් හෝ යම් නියෝගයක බලය පිට මිස අරමුදලෙහි සාමාජිකයකුට හෝ ඔහු යටතෙහි ඉල්ලුම් කරන යම් තැනැත්තකුට අරමුදලෙහි මුදල්වලට යම් සම්බන්ධතාවයක් හෝ හිමිකමක් නොතිබිය යුතු ය.

ල

*මේ පනත පරිපාලනය කිරීම.*

**4.** (1) මේ පනතෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇතොත් මිස, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා මේ පනතෙහි සාමාන්‍ය පරිපාලනය භාරව සිටිය යුතු ය.

(2) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයාගේ යම් සාමාන්‍ය හෝ විශේෂ නියමවලට යටත්ව, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ යම් නිලධාරියකු විසින් මේ පනත යටතේ හෝ මේ පනත සාදන ලද යම් නියෝගයක් යටතේ කොමසාරිස්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කළ හැකි ය.

(3) මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් ඇතුලු යම් නිලධාරීන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ හෝ යම් නියෝගයක් යටතේ සභාපතිවරයාගේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිවරයා විසින් මේ වගන්තියේ (3) වෙනි උපවගන්තිය යටතේ යම් නිලධරයකුට සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පැවරිය හැකිය.

අරමුදල සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයෙහි බලතල හා කාර්ය.

**5.** (1) මුදල් මණ්ඩලය විසින්—

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් පත් කළ හැකි ය. ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වැටුප් හා වේතන ද නියම කළ හැකි ය. ඔවුන්ගේ සේවා කොන්දේසි ද නිශ්චය කළ හැකි ය;

(ආ) දායක මුදල්, අධිභාර සහ ගාස්තු වශයෙන් මේ පනත යටතේ ගෙවනු ලබන සියලු මුදල් හා අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම භාර ගැනීම කළ යුතු ය. ඒ මුදල් හා ආදායම අරමුදලට බැර කළ යුතු ය;

(ඇ) අරමුදලෙහි මුදල්වල භාරය දැරිය යුතු ය;

(ඈ) සභාපතිවරයා විසින් සහතික කරනු ලබන තැනැත්තන්ට මේ පනත යටතේ හිමිකම් ලබන ප්‍රතිලාභ ගෙවිය යුතු ය;

(ඉ) මුදල්වලින් තුනෙන් දෙකකට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම තහවුරු කරමින් මේ පනතේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදලෙහි මුදල්, මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය;

(ඊ) අරමුදල සම්බන්ධයෙන් පොදු ගිණුමක් ද අරමුදලෙහි එක් එක් සාමාජිකයකු සම්බන්ධයෙන් (මේ පනතේ පෞද්ගලික ගිණුම යයි සඳහන් කරනු ලබන) වෙනම ගිණුමක් ද පවත්වා ගෙන යා යුතු ය;

(උ) 6 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති කාරණා සඳහා අවිනිශ්චිත ගිණුමක් පවත්වා ගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය;

(ඌ) අරමුදල සම්බන්ධ ගිණුම් පොත් සෑම වර්ෂයකම දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට තුලනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය;

(එ) එක් එක් වර්ෂය සඳහා අරමුදල සම්බන්ධයෙන් ලැබීම් හා ගෙවීම් විස්තරයක් ද, ආදායම් සහ වියදම් විස්තරයක් ද, වත්කම් හා බැරකම් විස්තරයක් ද එක් එක් ආයෝජනහි මුහුණත අගය, ගැනුම් මිළ හා වෙළඳපොළ අගය පෙන්නුම් කෙරෙන ආයෝජන විස්තරයක් ද සකස් කරනු ලැබීමට සැලැස්විය යුතු ය;

(ඒ) ඉහතින් වූ (එ) ඡේදය යටතේ එක් එක් වර්ෂය සඳහා සකස් කරන ලද එක් එක් විස්තරයෙහි පිටපතක් ඒ වර්ෂයෙහි දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට පසු තුන් මසක් ඇතුළත අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය;

(ඔ) එක් එක් වර්ෂයෙහි දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට පසු හය මසක් ඇතුළත, අරමුදලෙහි එක් එක් සාමාජිකයකුට එදිනට ඒ සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමෙහි ධන හෝ ඍණ ශේෂය වශයෙන් තිබෙන මුදල් ප්‍රමාණය දැනුම් දිය යුතු ය;

(ඕ) අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන්, මේ පනත යටතේ මණ්ඩලය සහ

සභාපතිවරයා සතු කාර්යයන් ඉටු කිරීමේ දී මණ්ඩලය සහ සභාපතිවරයා විසින් දරනු ලබන වියදම් අඩු කළ යුතු ය;

(ක) යම් හදිසි අවස්ථාවක් හෝ අරමුදලේ වත්කම්වල වෙළඳපළ අගයේ යම් ක්ෂය වීමක් සඳහා මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වූ සංචිත, අරමුදලේ ආදායමෙන් ඇති කළ හැකි ය;

(ග) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි හෝ පනවනු ලැබිය හැකි අරමුදල සම්බන්ධ වෙනත් බලතල හා කාර්යයන් ද හිමිවිය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ පත්කරන ලද සෑම නිලධරයකු හෝ සේවකයකුම, නිලධාරීන් හා සේවකයන් සම්බන්ධයෙන් මුදල් නීති පනතේ අඩංගු විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා එම පනත යටතේ කාර්ය ඉටු කිරීමට සේවයේ නියුක්ත කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ක) ඡේදයේ කාර්ය සඳහා "වියදම්" යන්නට—

(i) සොරකම් කිරීම, අයථා පරිහරණය හෝ වැඩියෙන් ගෙවීම නිසා ඇති වූ යම් මුදල් පාඩුවක්;

(ii) අරමුදල පරිපාලනයේ දී භාවිතා කරනු ලැබූ හෝ ඒ සඳහා මිළදී ගනු ලැබූ හෝ ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හෝ ලිපි ද්‍රව්‍ය නැති වී ඒවායේ වියදම එම නැතිවීමට වගකිව යුතු තැනැත්තන්ගෙන් අයකර ගත නොහැකි වීමෙන් ඇති වූ අලාභ; සහ

(iii) ප්‍රයෝජනයට ගත නොහැකි හෝ ක්‍රියාකාරී තත්වයේ නොමැති සහ අලුත්වැඩියා කළ නොහැකි යම් ලිපිද්‍රව්‍ය, ගෘහ භාණ්ඩ හෝ කාර්යාල උපකරණවල වටිනාමක

ඇතුළත් විය යුතු ය.

මුදල් මණ්ඩලයෙහි අවිනිශ්චිත ගිණුම.

**6.** (1) මේ පනත යටතේ ලැබුණා වූ ද, සපයන ලද වාර්තා ඌණතා සහිත හෝ සාවද්‍ය වාර්තා වීම හේතුවෙන් පෞද්ගලික ගිණුම්වලට බැර කරනු ලැබීමට නොහැකි වූ ද සියලු දායක මුදල්, මුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන අවිනිශ්චිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(2) අරමුදල විසින් පවත්වාගෙන ගනු ලබන ගිණුමක පවතින, ඉහත නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යම් මුදල්, මුදල් මණ්ඩලය විසින් අවිනිශ්චිත ගිණුමට මාරු කරනු ලැබිය යුතු ය.

(3) මෙම ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි අවිනිශ්චිත ගිණුමෙන් පෞද්ගලික ගිණුමකට මුදල් කිසිවක් මාරු කරනු ලබන අවස්ථාවක, ඒ මාරුකිරීම දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලසීමවක් නොඉක්මවන පරිදි එම මුදල් ලැබුණු දින සිට එම මුදල් පෞද්ගලික ගිණුමට මාරු කරුනු ලබන දින දක්වා වූ කාලසීමාව සඳහා එම මුදලට පොළියක් ගෙවනු ලැබිය යුතු අතර, පොළී අනුපාතය මේ පනතේ 13 (1) වන වගන්තිය අනුව තීරණය කරනු ලැබිය යුතු ය. තව ද ඒ පොළී අනුපාතය එය ගෙවනු ලබන වර්ෂය සඳහා අදාළ විය යුතු ය.

අරමුදලෙහි ගිණුම් ආදිය විගණකාධිපතිවරයා විසින් විගණනය කිරීම.

**7.** (1) එක් එක් අවුරුද්දක් සම්බන්ධයෙන් අරමුදලෙහි ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය. විගණනයෙහි ගාස්තු ඔහුට අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ විගණකාධිපතිවරයා කරනු ලබන සියලු ගෙවීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(2) විගණකාධිපතිවරයාට හෝ අරමුදලෙහි ගිණුම් විගණනය කිරීමට ඔහු විසින් බලය පවරනු ලැබූ ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ඒ ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා හෝ ඒ නිලධාරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු පොත්පත් සහ ලිපිලේඛන වෙත ප්‍රවේශවීමට ඉඩ තැබිය යුතු ය. තව ද මුදල් මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි ඔවුන් දන්නා හා ඔවුන් විසින් සොයා දැන ගත හැකි තොරතුරු විගණකාධිපතිවරයා හෝ ඒ නිලධරයා වෙත සැපයිය යුතු ය.

(3) විගණකාධිපතිවරයා විසින් අරමුදලෙහි ගිණුම් විගණනය කොට—

(අ) ඔහුට අවශ්‍ය සියලු තොරතුරු ඔහු විසින් ලබා ගනු ලැබුවේ ද, නැද්ද යනුවෙන් සඳහන් කරමින් ද ;

(ආ) විශ්‍රාම අරමුදලෙහි බැරට ඇති මුදල් සම්බන්ධයෙන් සත්‍ය හා නිවැරදි විශ්ලේෂණයක් දැක්වෙන පරිදි වාර්තාවෙහි සඳහන් ගිණුම් නිසි ලෙස සකස් කොට තිබේ ද යනුවෙන් සඳහන් කරමින් ද;

(ඇ) ඒ ගිණුම් සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක දී ඔහුගේ මතය අනුව පාර්ලිමේන්තුවට වැදගත් විය හැකි ය. ඒ ගිණුම්වල යම් අයිතමයකට අවධානය යොමු කරමින් ද,

අමාත්‍යවරයා වෙත වාර්තාවක් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු ය.

(4) අරමුදලෙහි කිසිදු සාමාජිකයකුගේ නම ඒ වාර්තාවෙන් අනාවරණය නොකළ යුතු ය.

(5) මේ වගන්තියේ (3) උප වගන්තිය යටතේ අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද, 5 වෙනි වගන්තියෙහි (ඔ) ඡේදය යටතේ මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාට සපයන ලද වාර්තාවල පිටපත් ද අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කළ යුතු ය.

8. ඒකාබද්ධ අරමුදලෙන්— රජයට කරන ගෙවීම්.

(අ) අරමුදල පිහිටුවීම සඳහා මූලික වැඩ කටයුතු සකස් කිරීමේ දී දරන ලද වියදම් පියවීම සඳහා මේ පනත පනවන දිනයට පෙර සභාපතිවරයාට ගෙවන ලද්දා වූ ද ;

(ආ) මේ පනත පනවන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා මුදල් මණ්ඩලය විසින් සහ සභාපතිවරයා විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුලු සියලු වියදම් පියවීම සඳහා මුදල් මණ්ඩලයට ගෙවන ලද්දා වූ ද,

සෑම ගෙවීමක් ම රජය විසින් මුදල් මණ්ඩලයට දෙන ලද ණයක් විය යුතු අතර මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්ව ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි නියම හා කොන්දේසිවලට අනුකූලව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

**9.** මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී සභාපතිවරයා සහ මුදල් මණ්ඩලය විසින් දරනු ලබන වියදම්, අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමට වැය බරක් විය යුතු ය. එසේ වුව ද, මෙම පනතේ IV වන කොටසේ විධිවිධානවල ඇති වියදම් අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් ගෙවිය යුතු ය. පනත ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද වියදම්.

II වන කොටස

**මේ පනත අදාළ වන සේවා නියුක්තයන්, ආවරණය වන වෘත්තීය සහ දායක මුදල්**

**10.** විදේශ රැකියාවක නියුක්ත වූ ද රජයේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හෝ කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් විශ්‍රාම වැටුප් අරමුදලක් යටතේ ආවරණය නොවන්නා වූ ද යම් තැනැත්තකුට, තම කැමැත්ත අනුව 2 වන වගන්තිය ප්‍රකාරව ස්ථාපිත කරන ලද අරමුදලෙහි සාමාජිකයකු බවට පත්විය හැකි අතර සාමාජිකයන් බවට පත්වන සියලුම සේවා නියුක්තයන් මේ පනත අදාළ වන තැනැත්තන් විය යුතු ය. මෙම පනත අදාළ වන සේවානියුක්තයන්.

**11.** (1) මෙම පනත අදාළ වන සේවානියුක්තයකුට ඒ සේවානියුක්තයා විදේශ රැකියාවක නියුක්තයා විදේශ රැකියාවක නියුතු කාල සීමාව තුළදී වසරකට රුපියල් දොළොස් දහසකට නොඅඩු දායක මුදලක් අවම වශයෙන් වසර දෙකක් තිස්සේ අඛණ්ඩව ගෙවීමෙන් සිය කැමැත්ත පරිදි මෙම අරමුදලට සම්බන්ධ විය හැකි ය (මේ වගන්තියේ කාර්ය "වසර" යන්නට ඕනෑම අඛණ්ඩ ලිත් මාස දොළහක් අදහස් විය යුතු ය.) ඒ දායක මුදල සේවානියුක්තයා විසින් තීරණය කරන පරිදි වාරික එකක් හෝ කිහිපයක් මගින් ගෙවනු ලැබිය හැකි ය. සේවානියුක්තයා විසින් මෙම අවම දායක මුදල ඒ සේවානියුක්තයාගේ වයස අවුරුදු පනස් පහ එළැඹීමට ප්‍රථම ගෙවිය යුතු ය. දායක මුදල්.

(2) මෙම අරමුදල—

(අ) මූලික ප්‍රාග්ධනය වශයෙන් රජය විසින් ඒකාබද්ධ අරමුදලෙන් වෙන කරනු ලැබිය යුතු රුපියල් මිලියන එක් දහසක මුදලකින් සමන්විත විය යුතු ය ;

(ආ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ස්ථාපිත අරමුදලෙහි 2011 අප්‍රේල් මස 1 වන දිනට බැර ශේෂය වශයෙන් පවතින මුදල් මෙම අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

දායක මුදල් ගෙවීමේ වගකීම ආරම්භ වීම.

**12.** (1) 10 වන වගන්තිය යටතේ දායක මුදල් ගෙවීම සඳහා සේවානියුක්තයකු සහ සභාපතිවරයාගේ හෝ වෙනත් යම් බලධරයකු සතු වගකීම, අමාත්‍යවරයා විසින් ඒ වෘත්තිය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරන ලද දිනයට ඉක්බිතිව ම වූ දිනයෙහි සිට ආරම්භ විය යුතු ය.

(2) මේ පනතේ 10 වන වගන්තියේ දක්වා ඇති විධිවිධානවලට යටත්ව මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් පසු ඕනෑම අවස්ථාවක, විදේශයක සේවා නියුක්ත යම් සේවානියුක්තයකුට මේ වගන්තිය යටතේ දායක මුදල් ගෙවීම ආරම්භ කළ හැකි ය.

දායක මුදල් ආදිය මත පොළිය.

**13.** (1) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව මුදල මණ්ඩලය විසින් වාර්ෂිකව නියම කරනු ලැබිය හැකි, වාර්ෂයකට සියයට දෙකයි දශම පහකට නොඅඩු වාර්ෂික පොළියක්, අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමෙහි බැරට තිබෙන මුදල මත, අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් මාසිකව පෞද්ගලික ගිණුම්වලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ අරමුදලට ගෙවනු ලැබූ දායක මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොළියෙහි යම් කොටසක් ගෙවීම සඳහා, අරමුදලෙහි මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන අවස්ථාවක එම හිඟය පාර්ලිමේන්තුව මගින් ඒ කාර්යය සඳහා දෙනු ලබන මුදල්වලින් පියවිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් දෙනු ලබන යම් මුදලක් රජය විසින් මුදල් මණ්ඩලයට දෙනු ලැබූ ණයක් විය යුතු අතර එය මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසි හා නියමයන් අනුව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා මෙම අරමුදල කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප් අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

දායක මුදල් අයකර ගැනීම.

**14.** (1) අරමුදලට අයවිය යුතු යම් මුදලක් රජයට අයවිය යුතු ණයක් මෙන්, ලඝු කාර්ය පටිපාටිය අනුව පැවරිය හැකි නඩුවක් මගින් අයකර ගනු ලැබිය යුතු ය. ලඝු කාර්ය පාටිපාටිය අදළ වන නඩුවලට සම්බන්ධ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන මේ වගන්තිය යටතේ වන නඩුවකට අදාළ විය යුතු ය. එබඳු නඩුවකට එබඳු විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්යය සඳහා පමණක් ඒ සංග්‍රහයෙහි 8 වන වගන්තිය, ඒ වගන්තියේ සඳහන් මේ ආඥා පනතින් යන වචන වෙනුවට “මේ ආඥා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින්” යන වචන ආදේශ කරනු ලැබුවාක් මෙන් බලපැවැත්විය යුතුය.

(2) සභාපතිවරයා හෝ ඔහු විසින් අදාළ කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් අරමුදලට අයවිය යුතු යම් මුදල් අයකර ගැනීම සඳහා නීති කටයුතු ඇරඹිය හැකි ය. වෙනත් යම් ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද සභාපතිවරයා හෝ ඒ නිලධරයා විසින් ඒ නීති කටයුතු පවත්වාගෙන යා හැකි ය.

(3) මේ පනත යටතේ අධිභාර හෝ දායක මුදල් වශයෙන් ගෙවිය යුතු යම් මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් කාලාවරෝධ ආඥා පනතෙහි විධිවිධාන අදාළ නොවිය යුතුය.

සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කළ යුතු මුදල්.

**15.** අරමුදලෙහි සාමාජිකයකු සහ ඔහු වෙනුවෙන් ඔහුගේ සේවායෝජකයා විසින් ගෙවන දායක මුදල් හා ඒ දායක මුදල් මත වන පොලිය මුදල් මණ්ඩලය විසින් ඒ සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට බැර කළ යුතු ය.

පෞද්ගලික ගිණුම්වල බැරට ඇති මුදල් අන්සතු කළ නොහැකි බව.

**16.** අරමුදලෙහි සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙහි බැරට ඇති යම් මුදලක් සම්බන්ධ සෑම පැවරීමක් හෝ අය කිරීමක් හා එවැනි මුදලක් පැවරීම හෝ ඉන් ගාස්තුවක් අය කිරීම සඳහා වන සෑම ගිවිසුමක්ම බලරහිත විය යුතු ය. නිසි අධිකරණයක් විසින් ඒ සාමාජිකයා වස්තුභංගත්වයට පත් වූ තැනැත්තකු වශයෙන් තීරණය කරනු ලැබූ අවස්ථාවක, වස්තුභංගත්ව ආඥා පනතෙහි විධිවිධාන කුමක් වුව ද, ඒ සාමාජිකයාගේ ණය හිමියන් වෙනුවෙන් ක්‍රියා කරන කිසිම පැවරුම් ලාභියකුට එබඳු යම් මුදලක් නොපැවරිය යුතු ය.

## III වන කොටස

### විශ්‍රාම වැටුප

විශ්‍රාම වැටුප ගෙවනු ලබන අවස්ථාව.

**17.** (1) මේ වගන්තියෙහි සඳහන් විධිවිධානවලට යටත්ව සහ 10 වන වගන්තිය ප්‍රකාර දායක මුදල් ගෙවීමට යටත්ව, අරමුදලේ යම් සාමාජිකයකුට ඒ සාමාජිකයා වයස අවුරුදු හැට පහ (65) එළඹීමේ දී මාසික විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ පනත අදාළ වන්නා වූ ද, අරමුදලෙහි සාමාජිකයකු වන්නා වූ ද, යම් තැනැත්තකු ජීවත්ව සිටින බව අවම වශයෙන් වාර්ෂිකව තහවුරු කරන ලෙසට අදාළ දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම නිලධාරි වෙත සභාපතිවරයා විසින් නියම කළ යුතු ය. ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් හෝ එවැන්නක් නොමැතිවිට, පවත්නා රාජ්‍ය තාන්ත්‍රික මාර්ග ඔස්සේ එකී තහවුරු කිරීම ලබාගත යුතු ය. යම් සාමාජිකයකු මිය ගොස් ඇති බව වාර්තා වුවහොත්, ඔහුගේ නම කපා හැරීමට කටයුතු කළ යුතු ය.

ඇතැම් අවස්ථාවල තැනැත්තන්ට එකවර ගෙවීමක් කිරීමට ඇති බලතල.

**18.** (1) යම් සාමාජිකයකු-

(අ) මේ පනතෙන් නියම කර ඇති පරිදි දායක මුදල් ගෙවා විශ්‍රාම වැටුපක් ලැබීමට පෙර ; හෝ

(ආ) මේ පනත යටතේ නියම කර ඇති පරිදි දායක මුදල් ගෙවීම සම්පූර්ණ නොකොට විශ්‍රාම වැටුපක් ලැබීමට පෙර,

වයස අවුරුදු දහ අට ට අඩු දරුවකු හෝ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් කායිකව හෝ මානසිකව ආබාධිත දරුවකු වශයෙන් සහතික කර ඇති, එහෙයින් ම තම ජීවිකාව කර ගෙන යාමට ඉපැයීමක් කළ නොහැකි යම් දරුවකු තබා මියගිය හොත් ඒ යැපෙන්නාට සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමෙහි බැරට ඇති මුදලින් සියයට හැටකට සමාන මුදලක් එකවර ගෙවිය යුතු ය. එක් යැපෙන්නකුට වඩා වැඩි සංඛ්‍යාවක් සිටී නම්, එම මුදල එම යැපෙන්නන් අතර සමානව බෙදනු ලැබිය යුතුය.

(2) අරමුදලෙහි යම් සාමාජිකයකු ස්ථිර අශක්නුතාවයක් හේතුවෙන් සේවා නියුක්තිය නතර වුවහොත් හා එ හේතුව මත

සේවයේ යෙදීම නුසුදුසු බවට ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කරන අවස්ථාවක සහ ඒ සාමාජිකයාට මේ පනත යටතේ නියම කර ඇති පරිදි දායක මුදල් ගෙවීම සම්පූර්ණ කිරීමට නොහැකි වූ අවස්ථාවක, ඒ සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට ඇති මුදලෙන් සියයට හැටකට සමාන මුදලක් ඒ සාමාජිකයාට ගෙවනු ලැබිය යුතු ය.

විශ්‍රාම වැටුපක් ලබාගැනීම සඳහා ඉල්ලීම.

**19.** මේ පනත යටතේ විශ්‍රාම වැටුපක් සඳහා යම් තැනැත්තකුට ඇති අයිතිය කෙරෙහි, ඔහු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ ඉඩදී ඇති අවස්ථාවල, නිශ්චිතව නියම කොට ඇති පරිදි ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීම කොන්දේසියක් විය යුතු ය.

## IV වන කොටස

### ඉල්ලීම් පිළිබඳව නිශ්චය කිරීම

සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් ඉල්ලීම් පිළිබඳ නිශ්චය කිරීම.

**20.** විශ්‍රාම වැටුප් සම්බන්ධ සියලු ඉල්ලීම් සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමෙහි පවතින ශේෂය මත පදනම් වන සභාපතිවරයාගේ හෝ ඒ නිලධරයාගේ ඒ නිශ්චය කිරීම, මේ පනතේ විධිවිධාන අනුව එබඳු නිශ්චය කිරීමකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් පිළිබඳ යම් තීරණයකට යටත්ව, අවසානාත්මක විය යුතු ය

එසේ වුව ද, මේ වගන්තිය යටතේ යම් නිලධරයකු විසින් කරන ලද යම් නිශ්චය කිරීමක් සභාපතිවරයා විසින් සිය අභිමතය මත නියමිත කාල සීමාව තුළ නැවත සලකා බැලිය හැකි ය. එවැනි අවස්ථාවක සභාපතිවරයාගේ නිශ්චය කිරීම 27 වන වගන්තියේ කාර්ය සඳහා, ඒ කාරණය පිළිබඳ නිශ්චය කිරීම වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අභියාචනා.

**21.** (1) 20 වන වගන්තිය යටතේ කරනු ලැබූ යම් නිශ්චය කිරීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ නිශ්චය කිරීමට විරුද්ධව නිශ්චිතව දක්වනු ලබන පරිදි පිහිටුවනු ලබන (මේ පනතේ මින්මතු “විනිශ්චය සභාව” යනුවෙන් හඳුන්වනු ලබන) අභියාචනා විනිශ්චය සභාවක් වෙත අභියාචනා කළ හැකි ය. ඒ අභියාචනය සම්බන්ධ විනිශ්චය සභාවේ තීරණය, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එබඳු තීරණයට විරුද්ධව

කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් කළ හැකි යම් ආඥාවකට යටත්ව, අවසානාත්මක විය යුතුය.

(2) සභාපතිවරයා හෝ විනිශ්චය සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ යම් පාර්ශ්වයක් ඒ අභියාචනය පිළිබඳ විනිශ්චය සභාවෙහි තීරණය සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අවස්ථාවක, සභාපතිවරයා හෝ ඒ පාර්ශ්වය විසින්, අභියාචනයට සම්බන්ධ අනෙක් සෑම පාර්ශ්වයක්ම වගඋත්තරකරුවකු වශයෙන් සඳහන් කරනු ලැබූ ලිඛිත පෙත්සමක මාර්ගයෙන්, ඒ තීරණයට විරුද්ධව නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනය කළ හැකි ය. විවාද කළ යුතු නීති ප්‍රශ්නය අභියාචනයා පෙත්සමෙහි දැක්විය යුතු ය. ඒ ප්‍රශ්නය අභියාචනාධිකරණය විසින් විනිශ්චය කිරීම සුදුසු බවට නීතිඥයකුගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතු ය. අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ විනිශ්චය සභාවේ යම් තීරණය විරුද්ධව ද ඒ තීරණයේ දිනයට පසු, දින විසි එකක් තුළ අභියාචක විසින් අභියාචනා පෙත්සම විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. වගඋත්තරකරුවන් වශයෙන් සඳහන් කරනු ලැබූ එක් එක් තැනැත්තකු වෙත භාර දීම සඳහා ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් ඒ සමග යැවිය යුතු ය. එවැනි සෑම අභියාචනා පෙත්සමක්ම නියමිත ගාස්තුව සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියෙහි නිශ්චිතව නියම කර ඇති ආකාරයට හා කාලය තුළ විනිශ්චය සභාවට අභියාචනා පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක—

(අ) පෙත්සම ඉදිරිපත් කරන ලද්දේ විනිශ්චය සභාවේ යම් තීරණයකට විරුද්ධව ද, ඒ තීරණය ගනු ලැබූ නීති කටයුතුවල වාර්තාව සමග පෙත්සම අභියාචනාධිකරණයට ඉදිරිපත් කරනු ලැබීමට සැලැසැවීම ; හා

(ආ) අභියාචනා පෙත්සමෙහි නම් සඳහන් කරන ලද එක් එක් වගඋත්තරකරුට අභියාචනා දැන්වීම හා අභියාචනා පෙත්සමෙහි පිටපතක් භාර දෙනු ලැබීමට සැලැස්වීම,

විනිශ්චය සභාවේ කාර්යය විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම ඒ අධිකරණයෙහි යම් විනිශ්චයකාරවරුන් දෙදෙනකු විසින් විමසා තීරණය කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ යම් අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් තීරණයක් දීමෙන් පසු, ඒ අධිකරණයෙහි රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අධිකරණ තීරණය සමග එම නඩුව විනිශ්චය සභාවට යැවිය යුතුය. එවිට ඒ අධිකරණ තීරණයෙන් නියම කරනු ලබයි නම්. අභියාචනය කරනු ලැබූ විනිශ්චය සභාවෙහි ඒ තීරණය, අධිකරණ තීරණයෙන් නියම කර ඇති ආකාරයට විනිශ්චය සභාව විසින් අවලංගු කිරීම හෝ වෙනස් කිරීම ද, අවශ්‍ය අවස්ථාවල දී ඒ අධිකරණ තීරණය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එදින සිට දින 30 ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් අලුත් තීරණයක් ලබාදීම ද විනිශ්චය සභාවෙහි කාර්යය විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරනු ලැබූ යම් අභියාචනයක දී ගාස්තු සම්බන්ධයෙන් ඒ අධිකරණයට සුදුසු යයි හැගෙන අන්දමේ ආඥාවක් ඒ අධිකරණය මගින් කරනු ලැබිය හැකි ය.

(7) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යයි මේ වගන්තියෙහි (6) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය මගින් නියම කරනු ලැබූ යම් ගාස්තු, මහෙස්ත්‍රාත් අධිකරණයෙහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීමේ දී ඒ අධිකරණය මගින් නියම කළ හැකි දඩ මුදල් ප්‍රමාණය නොතකා ඒ මහෙස්ත්‍රාත් අධිකරණය මගින් නියම කරනු ලැබූ දඩයක් මෙන්, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ තැනැත්තා පදිංචි ස්ථානයෙහි අධිකරණ බලය දරන මහෙස්ත්‍රාත් අධිකරණයට ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර අයකර ගත හැකි ය.

(8) මේ පනත යටතේ සාදන ලබන යම් නියෝගවලට යටත්ව විනිශ්චය සභාව විසින් එහි කාර්ය පටිපාටිය විධිමත් කළ හැකිය.

විනිශ්චය සභාවේ සාමාජිකයන් හට පාරිශ්‍රමික ගෙවීම.

**22.** මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකගගත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කළ හැකි යම් පාරිශ්‍රමික විනිශ්චය සභාවේ සමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

## V වන කොටස.

### සාමාන්‍ය කරුණු

වැරදි.

**23.** (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් උල්ලංඝනය කරනු ලබන ; හෝ

(ආ) තමාගේ දැනම අනුව අසත්‍ය හෝ සාවද්‍ය වන යම් තොරතුරු හෝ එවැනි තොරතුරු ඇතුළත් හෝ එහි යම් කොටසක එවැනි තොරතුරු ඇතුළත් යම් ලේඛනයක් මේ පනතේ කාර්ය සඳහා සපයන.

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

*වැරදි සඳහා දඬුවම්.*

**24.** මේ පනත යටතේ වරදකට වරදකරුවකු වන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරුවකු කිරීමෙන් පසු රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ හය මසකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර, වරදකරු කිරීමෙන් පසුව වරද අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සීයකට නොවැඩි අමතර දඩයකයට ද ඔහු යටත් විය යුතු ය.

*සභාපතිවරයාගේ අනුදැනුම නොමැතිව නඩු නොපැවරීම.*

**25.** සභාපතිවරයාගේ ලිඛිත අවසරයෙන් හෝ අවසරය ඇතිව මිස, මේ පනත යටතේ යම් වරදක් සඳහා කිසිදු නඩුවක් නොපැවරිය යුතු ය.

*නියෝග හා ආඥා ආදිය ඔප්පු කිරීම.*

**26.** (1) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ආඥාවක් පළ කරන ලද ගැසට් පත්‍රයෙන් උපුටා ගත් කොටසක් හෝ සභාපතිවරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරනු ලැබූ එවැනි නියෝගයක හේ ආඥාවක පිටපතක්, ඒ නියෝගය හෝ ආඥාව සත්‍ය බැව් ඔප්පු කිරීම සඳහා අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) යම් නීති කටයුත්තක දී—

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් ගිණුම් කාර්යයක් සඳහා මුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන යම් ගිණුම් පොතක් තුළ ඇති සටහනක සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද පිටපතක් ; හෝ

(ආ) සත්‍ය පිටපතක් යයි සභාපතිවරයා විසින් සහතික කරනු ලැබුවේ යයි අදහස් කෙරෙන, මේ පනතේ කාර්යයන් සඳහා ඔහු විසින් පවත්වාගෙන යනු ලබන යම් පොතක් හෝ වාර්තාවක් තුළ ඇති සටහනක පිටපතක් ;

ඒ සටහන කරනු ලැබූ බවට හා එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

*ආදායම් බද්දෙන් නිදහස් කිරීම.*

**27.** (1) මෙම අරමුදලෙහි ඇති යම් මුදලක් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම ආදායම් බදු පැනවීම හා සම්බන්ධ යම් ලිඛිත නීතියක් යටතේ අය කළ යුතු ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) මෙම අරමුදල 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම වැටුප් අරමුදලක් ලෙස සලකනු ලැබිය හැකි ය.

මේ උපවගන්තියේ "කොමසාරිස්වරයා" සහ "කොමසාරිස් ජනරාල්වරයා" යන්නට 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සඳහන් අර්ථය තිබිය යුතු ය.

*මුද්දර බද්දෙන් නිදහස් කිරීම.*

**28.** මේ පනතේ කාර්යයන් සම්බන්ධයෙන් යොදාගනු ලබන, නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් ලේඛන සඳහා මුද්දර ගාස්තු අය නොකළ යුතු ය.

*මේ පනත යටතේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධනේ ආරක්ෂාව.*

**29.** මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකුට විරුද්ධව නඩුවක් හෝ පැමිණිල්ලක් හෝ වෙනස් නීති කෘත්‍යයක් නොපැවැත්විය යුතු ය.

*නියෝග.*

**30.** (1) අමාත්‍යවරයා විසින් මේ පනතේ අඩංගු ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සහ මෙම පනත මගින් නිශ්චිතව දැක්විය යුතු යයි නියම කොට ඇති කාරණා හෝ නියෝග සෑදීමට බලය දී ඇති හෝ නියම කර ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවර ඇති බලතලවල සාමාන්‍ය ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු කාරණා හෝ එහි සඳහන් යම් කාරණාවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(අ) මේ පනත යටතේ දායක මුදල් හා වෙනත් ගෙවීම් එකතු කිරීම හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික වන සියලු කරුණු සම්බන්ධයෙන් ද ;

(ආ) අරමුදලට වැරදීමකින් ගෙවන ලද යම මුදලක් ආපසු ගෙවීම සම්බන්ධයෙන් ද ;

(ඇ) දරුවකු වූ හෝ ඒ අවස්ථාවේ දි ක්‍රියාකිරීමට නොහැකි තැනැත්තකු වූ ප්‍රතිලාභයකට හිමිකම් කියන්නකුට මේ පනත යටතෙහි ක්‍රියාත්මක කිරීමට හිමිකම් ඇති යම් අයිතිවාසිකමක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් කියන්නා වෙනුවෙන් තැතැන්තකු පත් කරනු ලැබීමට හැකිවීම සඳහා ද, හිමිකම් කියන්නකුට හිමිකමක් ඇති ප්‍රතිලාභයක් භාර ගැනීමට හා ඒ සම්බන්ධව ක්‍රියාකිරීමට එසේ පත් කරන ලද තැනැත්තකුට බලය පැවරීම සඳහ ද ;

(ඈ) සාමජිකයකු මිය ගිය අවස්ථාවක අරමුදලෙහි ඒ සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදල ගෙවනු ලැබිය හැකි තැනැත්තකු සම්බන්ධයෙන් ද ;

(ඉ) මේ පනත යටතේ සංස්ථාපිත විනිශ්චය සභාවකට අභියාචනා ඉදිරිපත් කළ යුත්තේ කුමන අන්දමකට ද හා කුමන කාලයක් ඇතුළත ද යන්න සම්බන්ධයෙන් ද ;

(ඊ) අභියාචනා සඳහා ඒ විනිශ්චය සභාවට ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් ද ;

(උ) ඒ විනිශ්චය සභාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය හා ක්‍රියාත්මත කළ හැකි බලතල සම්බන්ධයෙන් ද ;

(ඌ) විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනයක පාර්ශ්වකරුවකුට විරුද්ධව ඒ විනිශ්චය සභාව විසින් ගාස්තු ප්‍රදානය කළ හැකි අවස්ථා හා ඒ ගාස්තු අයකර ගතයුතු ආකාරය සම්බන්ධයෙන් ද ;

(එ) (i) මේ පනත යටතේ (මුල් අවස්ථාවේදී හෝ අභියාචනයේදී ) යම් ප්‍රතිලාභයක් හා සම්බන්ධ යම් ඉල්ලීමක් හෝ ප්‍රතිලාභයක් සඳහා ඇති යම් තැනැත්තකුගේ අයිතිවාසිකම කෙරෙහි හෝ අරමුදලට දායක මුදල් ගෙවීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ වගකීම කෙරෙහි බලපාන යම් ප්‍රශ්ණයක් නිශ්චය කරනතුරු ; හෝ

(ii) එබඳු ඉල්ලීමක් හෝ ප්‍රශ්නයක් පිළිබඳ යම් තීරණයක් සම්බන්ධයෙන් විනිශ්චය සභාවට කරන අභියාචනයක් මත කෙරෙන ප්‍රතිශෝධනයකින්,

පැන නගින කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද ;

(ඒ) යම් විශ්‍රාම වැටුපක් සඳහා කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් නිශ්චය කිරීමක් සභාපතිවරයා විසින් නැවත සලකා බලනතුරු ඒ විශ්‍රාම වැටුප ප්‍රදානය කිරීම අත්හිටුවීම සඳහා ද ;

(ඔ) නොගෙවිය යුතු යයි පසුව තීරණය කරනු ලබන, මේ පනත යටතේ කරන ලද යම් නිශ්චය කිරීමක් යටතේ හෝ යම් නියෝගයක යම් විධිවිධානයක් ප්‍රකාරව යම් තැනැත්තකුට ගෙවනු ලැබූ යම් මුදලක් නිසියාකාරව ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබීම සඳහා හෝ ඔහු විසින් ආපසු ගෙවීම සඳහා සහ ඔහුගෙන් ඒ මුදල ආපසු ලබා ගැනීම සඳහා ද ;

(ඕ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ යොදවනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට දීමනා ගෙවීම හා ඒ දීමනා ගණනය කිරීමේ ක්‍රමය සඳහ ද ;

(ක) මෙම පනත පරිපාලනය කිරීමේ දී දැරීමට සිදුවිය හැකි පාඩු කපා හැරීම සඳහා අය කළ යුතු ගාස්තු අයකර ගැනීම සඳහා ; සහ

(ග) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාවේ යෙදවීම හෝ එහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් ද,

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින හෝ නියෝගවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ ඉන් පෙර සිදු කරන ලද යම් ක්‍රියාවකට අගතියක් නොවන පරිදි, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

*අර්ථ නිරූපනය*

**31.** මේ පනතෙහි පද සංසන්දනයෙන් වෙනත් අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස.

"සභාපතිවරයා" යන්නෙන් 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා අදහස් වේ.

"සේවා නියුක්තයා" යන්නෙන් විදේශයක සේවා නියුක්ත රජයේ විශ්‍රාම වැටුප් ව්‍යාවස්ථා සංග්‍රහයේ හෝ කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් විශ්‍රාම වැටුප් අරමුදලක් යටතේ ආවරණය නොවන යම් තැනැත්තකු අදහස් වේ.

"මුදල් මණ්ඩලය" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද මුදල් මණ්ඩලය අදහස් වේ.

*වෙනත් ලිඛිත නීතියක් සමග ගැටුමක් ඇතිවන අවස්ථාවක පනත බලපාන බව*

**32.** අන් කිසි ලිඛිත නීතයක කුමක් සඳහන් වුව ද, මේ පනතෙහි විධිවිධාන බල පැවැත්විය යුතු ය. මේ පනතෙහි විධිවිධාන හා එවැනි වෙනත් නීතියක් අතර ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වන යම් අවස්ථාවක මේ පනතෙහි විධිවිධාන බලපැවැත්විය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**33.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.